# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2328/13 - 2023 අප්‍රේල් මස 21 වැනි සිකුරාදා - 2023.04.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත**

2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනතේ 09 වන වගන්තිය පරිදි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනවල සඳහන් අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය 2023 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රකාශයට පත් කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 අප්‍රේල් මස 21 වැනි දින.

I වන උපලේඛනය

**අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය**

| *සුභසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබන සමාජ කාණ්ඩය* | | *සුභසාධක ප්‍රතිලාභී තැනැත්තන්/පවුල් සංඛ්‍යාව* | *පවුල් ඒකකයක් සඳහා වන යෝජිත මාසික සුභසාධන ප්‍රතිලාභ දීමනාව (රු.) ** |
|---|---|---|---|
| (i) | **සංක්‍රාන්තික**<br>2023 දෙසැම්බර් මස 31 දක්වා | 400,000 | 2,500 |
| (ii) | **අවදානමට ලක් වූ**<br>2024 මාර්තු මස 31 දක්වා | 400,000 | 5,000 |
| (iii) | **දුප්පත්**<br>2023 ජූලි 01 සිට වසර 03 ක් දක්වා | 800,000 | 8,500 |
| (iv) | **අන්ත දිළිඳු**<br>2023 ජූලි 01 සිට වසර 03 ක් දක්වා | 400,000 | 15,000 |

* *සටහන* - පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව 2 හෝ 2 ට අඩු වන අවස්ථාවක ප්‍රතිලාභින් සඳහා උක්ත දීමනාවෙන් අඩක් පමණක් ගෙවිය යුතු ය.

1A - PG 6295 — 381 (2023/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## II වන උපලේඛනය

**වෙනස් හැකියාවන් සහිත තැතැන්තන්, හඳුනානොගත් වකුගඩු රෝගීන්, වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් සඳහා ගෙවීම්**

| *සුබසාධක ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩය (1)* | | *දැනට සුබසාධක ප්‍රතිලාභ ලබන තැනැත්තන් සංඛ්‍යාව (2)* | *පවුල් ඒකකයට අයත් තැනැත්තන් සංඛ්‍යාව දළ වශයෙන් ** (3)* | *මාසික සුබසාධන ප්‍රතිලාභ දීමනාව (රු.) (4)* |
|---|---|---|---|---|
| (i) | ආධාර ලබන වෙනස් හැකියාවන් සහිත තැනැත්තන් | 72,000 | 21,000 | 5,000 |
| (ii) | වකුගඩු ආධාර ලබන තැනැත්තන් | 39,150 | 19,500 | 5,000 |
| (iii) | වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් | 416,667 | 250,000 | 2,000 |

** *සටහන* - II වන උපලේඛනයෙහි (3) වන තීරුවේ සඳහන් දීමනා හිමි පවුල් ඒකකයට අයත් තැනැත්තන් ඉහත I වන උපලේඛනයෙහි සඳහන් ප්‍රතිලාභ ලබන පවුල ඒකකයක් තුළට ඇතුළත් වන බැවින් ගෙවීම් සිදු කිරීමේ දී එකී I වන උපලේඛනයේ හිමි දීමනාවට මෙම II වන උපලේඛනයෙහි (4) වන තීරුවේ සඳහන් දීමනාව ද එකතුකර ගෙවීම් සිදු කළ යුතු ය.

උපලේඛන II හි සඳහන් ප්‍රතිලාභ වසරක කාලයක් සඳහා ලබා දිය යුතු අතර, සුදුසුකම් සමාලෝචනය කිරීමෙන් අනතුරුව එම ප්‍රතිලාභ තවදුරටත් ලබාදීමට කටයුතු කිරීම.

EOG 04 - 0130

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.